තඹලගමුව ප්‍රාදේශීය සභාව
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
----------------------

1. මූල්‍ය ප්‍රකාශන
--------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2017 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 28 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 17 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට තඹලගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

සමාලෝචිත වර්ෂයතුළදී රු.4,325,150 ක මුළු පිරිවැයකින් සභාව විසින් ඉදිකරන ලද මහජන පුස්තකාලයේ වටිනාකම, ඉඩම සහ ගොඩනැගිලි ගිණුමේ සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායකවීමේ ගිණුමේ රු.4,414,031 ක් ලෙස සටහන් කිරීම නිසා ඉඩම් සහ ගොඩනැගිලි වටිනාකම රු.88,881 කින් වැඩියෙන් දැක්වීමට හේතුවී තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැති කම
--------------------------------------

වටිනාකම රු.53,684,419 ක්වූ ඉඩම්, ගොඩනැගිලි යන්ත්‍රාගාර සහ යන්ත්‍ර, මෝටර් වාහන කරත්ත සහ උපකරණ සඳහා ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. එනිසා විගණනයේදී එම ශේෂය තහවුරු කළ නොහැකි විය.

1.3.3 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම
-------------------------------------------------------------------

| නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (i) පරිච්ඡේදයේ ix වගන්තිය 180 | නිලධාරීන් තිදෙනෙකුට මුදල් ගබඩා සහ චෙක්පත් සම්බන්ධව කටයුතු කිරීම් පරිපාලනමය වශයෙන් පවරා තිබුණි. එනමුත් ඔවුන්ගෙන් ලබාගත යුතු ඇප තැන්පතු නිශ්චය කර ඒ අනුව අයකිරීම් කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ii) | පරිච්ඡේදය X වගන්තිය 193 | විගණකාධිපතිට ඉදිරිපත් කිරීම සඳහා විචලනවලට හේතු දක්වන ප්‍රකාශ සැකසීම පිණිස වර්ෂය සඳහා වූ තත්‍ය ආදායම් හා වියදම් අයවැයගත ආදායම් හා වියදම් සමඟ සසදා නොතිබුණි. |
| (ආ) | පළාත් භාණ්ඩාගාර චක්‍රලේඛ අංක පීටීඒ/2017 | ප්‍රාදේශීය සභාවන් විසින් සිදුකළ යුතු මිලට ගැනීම් උපරිමය රු.500,000 කට සීමාකර ඇත. එනමුත් වෙන් වෙන්ව මිල ගණන් දෙකක් කැඳවනු ලැබ, 2017 නොවැම්බර් 16 දින රු.621,381 ක ලී බඩු මිලට ගෙන තිබුණි. එම මුදල් ප්‍රමාණ පිළිවෙලින් රු.230,500 ක් සහ රු.380,880 ක් විය. |

## 2. මූල්‍ය සමාලෝචනය
----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල
---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.2,719,558 ක්වූ අතර, ඊට අනුරූපී ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්මවූ ආදායම රු.393,131 ක මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

### 2.2 ආදායම් පරිපාලනය
-----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්
------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා වූ ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තුගත ආදායම බිල්කළ ආදායම්, රැස්කළ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු | රු. | රු. | රු. |
| කුලී | 11,019 | 6,502 | 6,348 | 153 | 9,157 | 8,187 | 8,184 | 3 |
| බලපත්‍ර ගාස්තු | 1,250 | 1,024 | 1,024 | - | 930 | 990 | 990 | - |
| වෙනත් ආදායම් | 2,321 | 2,141 | 1,906 | 235 | 1,056 | 361 | 361 | - |

### 2.3 වරිපනම් හා බදු
-------------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වර්ෂය ප්‍රකාරව වරිපනම් හා බදු අය කර ගැනීම පිණිස, සභා ප්‍රදේශය තුළ වූ නිශ්චල දේපළ හඳුනාගෙන වටිනාකම් තක්සේරු කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

2.4 මුද්දර ගාස්තු

----------------

2016 සහ 2017 වර්ෂ සඳහා ලැබිය යුතු මුද්දර ගාස්තු ගණනය කර රෙජිස්ට්‍රාර් ජනරාල් වෙතින් අයකර ගැනීම සඳහා කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

(අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

---------------------------------

සභා ප්‍රදේශය තුළ රැස්කෙරෙන කසළ පාලම්පොතආරු ප්‍රදේශයේ බැහැර කර තිබුණි. ප්‍රදේශයේ අලින්, ඔවුන්ගේ ජීවිතවලට අනතුරුදායක තත්ත්වයක් සිදු කරමින් මෙම කසල පරිභෝජනය කරති.

(ආ) තිරසාර සංවර්ධන ඉලක්ක

-----------------------------

2017 අංක 19 තිරසාර සංවර්ධන ඉලක්ක පනතේ අරමුණු සහ ඉලක්ක සභාව විසින් හඳුනාගෙන තිබු නමුත්, 2030 වන විට සාක්ෂාත් කර ගත හැකි තිරසාර සංවර්ධන ඉලක්ක වැඩසටහන සභාව විසින් පිළියෙල කර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේදී රු.11,999,424 ක ණය මුදලක් සභාව විසින් දේශීය ණය සහ සංවර්ධන අරමුදලින් ලබාගෙන තිබුණි. රු.3,290,367 ක්වූ පොලිය සමඟ ණය මුදල බේරුම් කිරීම සඳහා මේ දක්වාම සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) 2013 සහ 2014 වර්ෂවලදී සභාව විසින් නිකුත් කළ කුවිතාන්සි පොත් නවයක් 2015 වර්ෂයේදී අස්ථානගතවී තිබුණි. කුවිතාන්සි භාර නිලධාරියා විසින් රැස් කරන ලද මුදල් සභාවට භාරදී නොතිබුණි. පාඩුව නිශ්චය කර ඒ අනුව අයකිරීම සිදු කිරීම සඳහා පළාත් මූල්‍ය රීති 71.3 ප්‍රකාරව අදාළ නිලධාරියාට එරෙහිව විනයානුකූල කටයුතු සිදුකර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

----------------------------------

ස්ථාන මාරුවී ගිය හෝ තනතුර හැර ගිය සේවකයන් වෙතින් ලැබිය යුතු රු.18,527 ක්වූ මුදල් අයකර ගැනීමට හෝ එය අදාළ ඇපකරුවන් වෙතින් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.4 වත්කම් කළමනාකරණය

---------------------------

3.4.1 අක්‍රීය වත්කම්

---------------

පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරේ.

(අ) අලුත්වැඩියා කර භාවිතා කළ හැකි සභාවේ මෝටර් සයිකල් 2 ක් වසර 03 ක් තිස්සේ අක්‍රීයව පැවතිණි.

(ආ) සභාවට අයත් තම්බලාගමම් වෙළඳ පොළ රු.531,996 ක් වැයකර 2015 දෙසැම්බර් 25 දින අලුත්වැඩියා කර තිබුණි. එනමුත්, මෙය 2018 මැයි 02 වන විටත් අක්‍රීයව පැවතුණි.

3.4.2 වාර්ෂික සමීක්ෂණ මණ්ඩලය

----------------------------

2016 සමීක්ෂණ මණ්ඩලය විසින් නිර්දේශිත පරිදි භාණ්ඩ අයිතම 33 ක් විකිණීම, භාණ්ඩ අයිතම 11 ක් අලුත්වැඩියා කිරීම සහ භාණ්ඩ අයිතම 06 ක් විනාශ කිරීම 2018 මැයි 02 දිනටත් සිදු කර නොතිබුණි.

3.4.3 අනාර්ථික ගනුදෙනු

----------------------

1980 අංක 46 දරන සේවක අරමුදල් පනත ප්‍රකාරව, සේවක භාරකාර අරමුදලට දායක මුදල් අදාළ මාසයේ අවසානයට පෙර අරමුදලට ප්‍රේෂණය කළ යුතු වේ. එනමුත්, 2012 ජනවාරි සිට 2016 අප්‍රේල් දක්වා කාල පරිච්ඡේදය සඳහා සභා සේවකයන්ගේ සේවක භාරකාර අරමුදලේ දායක මුදල් එපරිදි ප්‍රේෂණය කර නොතිබුණි. එනිසා රු.52,673 ක්වූ අධිභාර ගෙවා තිබුණි.

3.6 ප්‍රසම්පාදන

----------------

3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

----------------------

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2006 මාර්තු 24 දිනැති අංක 128 චකලේඛය ප්‍රකාරව, සභාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3.6.2 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

වෙළඳපොළ ගොඩනැගිල්ල ඉදිකිරීම

-------------------------------------

පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රාදේශීය සභා සවිමත් කිරීමේ වැඩසටහන යටතේ රු.10,743,042 ක මුදලකට වෙළඳපොළ ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව පිළිබඳව පහත සඳහන් නිරීක්ෂණ සිදු කෙරේ.

i. විගණනය සිදු කළ 2018 මාර්තු 23 දිනට රු.3,277,422 කට ඇස්තමේන්තුගත කාර්යයන් නිමකර නොතිබුණි. එනමුත් වගකිව යුතු නිලධාරීන් විසින් එකී වැඩ නිමකර ඇති බවට සහතික කර තිබුණි.

ii. 2018 ජනවාරි 22 වන විට නිම කළ යුතුව තිබූ මෙකී වැඩ විගණනය සිදු කළ 2018 මාර්තු 23 දින වන විටත් කොන්ත්‍රාත්කරු විසින් නිමකර නොතිබුණි. රු.537,152 ක්වූ ප්‍රමාද ගාස්තු කොන්ත්‍රාත්කරුගෙන් අයකර නොතිබුණි.

4. වගකීම්භාරය සහ යහපාලනය

-------------------------------

4.1 අයවැය පාලනය

--------------------

අයවැයගත හා තත්‍ය වියදම් අතර සියයට 12 සිට 80 දක්වා වූ පරාසයක විචලනයක් නිරීක්ෂණය වූයෙන්, අයවැය කාර්යක්ෂම කළමනාකරණ පාලකයන් වශයෙන් යොදාගෙන නොතිබූ බැව් නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන

--------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය අවශ්‍ය වේ.

| පද්ධති හා පාලනය | අවධානය අවශ්‍ය කරුණු |
| --- | --- |
| (අ) ස්ථාවර වත්කම් පාලනය | i. ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කිරීම<br>ii. සභාවේ අක්‍රීය වත්කම් භාවිතය සඳහා කටයුතු කළ යුතුවේ. |
| (ආ) ආදායම් පරිපාලනය | හිඟ ආදායම් රැස්කිරීම සඳහා කටයුතු කළ යුතු වේ |
| (ඇ) කොන්ත්‍රාත් පරිපාලනය | i. කොන්ත්‍රාත් සඳහා ප්‍රසම්පාදන පරිපාටිය අනුගමනය කළ යුතු වේ.<br>ii. ප්‍රජා මධ්‍යස්ථානවලට කොන්ත්‍රාත් පිරිනැමීමේදී මුදල් කොමිසමේ චක්‍රලේඛ උපදෙස් අනුගමනය කළ යුතු වේ. |